;


රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிர்வாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
**Ministry of Public Administration, Provincial Councils and Local Government**

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව    சுதந்திர சதுக்கம், கொழும்பு 07,இலங்கை.    Independence Square, Colombo 07, Sri Lanka

දුරකථන / தொலைபேசி / Telephone: 011-2696211-13, 011-2166000
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2695279
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail: info@pubad.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Telephone: www.pubad.gov.lk


මගේ අංකය / எனது இல / My No: MPubAd/ AcSD/Spl.Grade/2026
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2026.08.20

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
කොමිෂන් සභා ලේකම්වරුන්
දිස්ත්‍රික් ලේකම්වරුන් / දිසාපතිවරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයෙහි I ශ්‍රේණියේ නිලධාරීන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීම</u>**

අංක 1670/33 දරණ 2010.09.10 වන දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබූ ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවා ව්‍යවස්ථා සංග්‍රහයට අංක 2323/29 දරණ 2023.03.16 වන දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශයට පත් කරන ලද 08 වන ව්‍යවස්ථා සංශෝධනයේ විධිවිධාන අනුව 2026.07.01 දිනට ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ විශේෂ ශ්‍රේණියේ අනුමත තනතුරු සංඛ්‍යාවේ පවත්නා පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලැබූ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලැබී ඇත.

02. ඒ අනුව ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ විශේෂ ශ්‍රේණියේ 2026.07.01 දිනට පවත්නා පුරප්පාඩු අටක් (08)ක් පිරවීම සඳහා අයදුම්පත් කැඳවා සුදුසුකම්ලත් නිලධාරීන් අතරින් ජ්‍යෙෂ්ඨතා ලේඛනයේ අනුපිළිවෙළ අනුව පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් වන නිලධාරීන් සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට මෙයින් කටයුතු කරනු ලැබේ.

03. විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා සපුරාලිය යුතු සුදුසුකම්

I. සේවා ව්‍යවස්ථාවේ V වන පරිශිෂ්ඨයේ සඳහන් කවර හෝ සුදුසුකමක් සපුරා තිබීම (ඇමුණුම I).

II. උසස් කිරීමේ දිනට සේවයේ පළමු ශ්‍රේණියේ වසර පහ (05) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා පළමු ශ්‍රේණියට උසස් කිරීමෙන් පසු වැටුප් වර්ධක පහ (05) ක් උපයාගෙන තිබීම හා 2026.07.01 දිනට සක්‍රීය සේවයේ නියුතු නිලධාරියෙකු වීම.

III. උසස් කිරීමේ දිනට සේවයේ වසර දහඅට (18) කට නොඅඩු සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

IV. උසස් කිරීමේ දිනට පූර්වාසන්න වසර පහ (05) තුළ වාර්ෂික කාර්යසාධනය සතුටුදායක හෝ ඉහල මට්ටමක පැවතීම.

V. උසස් කිරීමේ දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොමැති වීම.

VI. තුන්වන කාර්යක්ෂමතා කඩඉම නියමිත දිනට සම්පූර්ණ කර තිබීම හෝ නිදහස් කර තිබීම.

04. උසස් කිරීමේ ක්‍රමය

4.1 සේවා ව්‍යවස්ථාවට අංක 2323/29 හා 2023.03.16 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මඟින් සිදු කරන ලද 08 වන සංශෝධනයේ 10.3.2 ඡේදයට අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් 2026.07.01 දිනට පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයකට නොවැඩි අයදුම්කරුවන් සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණයට භාජනය කර විශේෂ ශ්‍රේණියට පත්කිරීම සඳහා වන නිර්දේශයන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

4.2 ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින්, සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලබන නිර්දේශ අනුව I ශ්‍රේණියේ සිටින නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙල අනුව 2026.07.01 දිනට විශේෂ ශ්‍රේණියේ පවතින පුරප්පාඩු සංඛ්‍යාවට සමාන නිලධාරීන් සංඛ්‍යාවක් විශේෂ ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

05. විශේෂ ශ්‍රේණියට උසස් කරනු ලබන නිලධාරීන් විශේෂ ශ්‍රේණිය යටතේ අනුමත කර ඇති තනතුරකට පත්කරනු ලැබීමෙන් අනතුරුව එම පත්වීම් ලිපිය ලද දින සිට වැඩ කරන දින 22ක කාලයක් තුළ නව තනතුරේ වැඩ භාර ගැනීමට කටයුතු කළ යුත්තේය. එලෙස රාජකාරි සඳහා මාසයක් තුළ වාර්තා නොකරනු ලබන නිලධාරීන්ගේ විශේෂ ශ්‍රේණියේ උසස්වීම, රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2021(ii) හි විධිවිධාන ප්‍රකාරව අවලංගු කිරීමට කටයුතු කරනු ලැබේ.

06. 2026.07.01 දිනට පවත්නා පුරප්පාඩු සඳහා උසස්වීම් කරනු ලබන බැවින් එදිනට සක්‍රීය සේවයේ නියුතු සුදුසුකම් ලබන නිලධාරීන් තමා විසින් මේ සමඟ වන ආකෘතියට අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත අමාත්‍යාංශ ලේකම්වරුන්, ප්‍රධාන ලේකම්වරුන්, දිස්ත්‍රික් ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් මඟින් මා වෙත 2026.09.04 දින හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතු අතර එහි ප්‍රගමන පිටපත accservicediv@pubad.gov.lk විද්‍යුත් තැපැල වෙත යොමුකළ යුතුය. එදිනට පසුව එවන අයදුම්පත් කිසිදු හේතුවක් මත භාරගනු නොලබන අතර සදොස්ව හා අසම්පූර්ණව එවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. 2026.07.01 දිනට ඉහත සඳහන් මූලික සුදුසුකම් සපුරා ඇත්නම් පමණක්, අයදුම්පත් ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන් දැනුවත් කරන මෙන් දන්වා සිටින අතර, ඉහත 03 ඡේදයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති, පෙර උසස්වීම් අවස්ථාවේදී සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටි නමුත් උසස්වීම් නොලද හෝ ඉල්ලුම් කිරීමට නොහැකි වූ නිලධාරීන්ට ද මෙම උසස්වීම් සඳහා ඉල්ලුම් කළ හැකිය.

08. තව ද 2026.01.01 දිනට ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා පැවති සම්මුඛ පරීක්ෂණයට සහභාගී වූ නිලධාරීන් මෙම නිවේදනය අනුව අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී, අයදුම්පත සමඟ 2026.01.01 සිට 2026.07.01 දක්වා වන වැටුප් වර්ධක පත්‍රිකා පමණක් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් වේ.

09. මේ සම්බන්ධයෙන් අදාළ නිලධාරීන් දැනුවත් කරන්නේ නම් මැනවි.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

දුරකතන : 011-2696211-13 (දිගුව - 132 / 218 ) / 0112698672
ෆැක්ස් : 0112693304
විද්‍යුත් ලිපිනය : accservicediv@pubad.gov.lk

(ඇමුණුම I)

## <u>ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවා ව්‍යවස්ථාවේ V වැනි පරිශිෂ්ටය</u>

පහත දැක්වෙන සුදුසුකම්වලින් කවර හෝ සුදුසුකමක් ලබා තිබීම.

I. අදාළ වෘත්තීය පාඨමාලාවක් හදාරා ඇති එක්සත් රාජධානියේ වරලත් රාජ්‍ය මූල්‍ය හා ගිණුම් ආයතනයේ සාමාජිකත්වය හෝ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ හෝ **වරලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ හෝ සහතික ලත් වරලත් ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ සාමාජිකත්වය;**

හෝ

II. **රාජ්‍ය මූල්‍ය කළමනාකරණය, මූල්‍ය කළමනාකරණය, රාජ්‍ය මූල්‍ය, ගිණුම්කරණය, සංවර්ධන මූල්‍ය, වාණිජ්‍ය, ආර්ථික විද්‍යාව, ව්‍යාපාර පරිපාලනය, රාජ්‍ය කළමනාකරණය, තොරතුරු තාක්ෂණය, රාජ්‍ය ප්‍රතිපත්ති, ව්‍යාපෘති කළමනාකරණය** වැනි අදාළ ක්ෂේත්‍රයන් පිළිබඳව පිළිගත් විශ්වවිද්‍යාලයක් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කළ ආයතනයක් වෙතින් පශ්චාත් උපාධියක් ලබා තිබීම;

හෝ

III. ඉහත (II) වැනි අනු ඡේදයෙහි සඳහන් ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සහිතව යම් විෂය ක්ෂේත්‍රයක් පිළිබඳව පිළිගත් විශ්වවිද්‍යාලයක් වෙතින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කළ විශ්වවිද්‍යාලයකින් ශාස්ත්‍රපති මට්ටමේ පශ්චාත් උපාධියක් ලබා තිබීම;

හෝ

IV. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් ඉහත II ඡේදයේ දැක්වෙන විෂය ක්ෂේත්‍රයන්ගෙන් එකක් පිළිබඳව පිරිනමන පශ්චාත් උපාධියක් ;

හෝ

V. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් ඉහත II ඡේදයේ දැක්වෙන විෂය ක්ෂේත්‍රයන්ගෙන් එකක් පිළිබඳ පිරිනමන පශ්චාත් උපාධිය ඩිප්ලෝමාවක් සහිතව පිළිගත් විශ්වවිද්‍යාලයක් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කළ විශ්වවිද්‍යාලයකින් පශ්චාත් උපාධියක් ලබා තිබීම.

**ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයෙහි I ශ්‍රේණියේ නිලධාරීන්**
**විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා වන අයදුම්පත**

කාර්යාලීය ප්‍රයෝජනය පිණිසයි

| අයදුම්පත් අංකය | | |
|---|---|---|
| | **S** | |
| | **F** | |

**(අ) කොටස - නිලධාරියා විසින් සම්පූර්ණ කළ යුතුය.**

1. නම :……………………………………………………………………………........………………….
   1.1 සම්පූර්ණ නම :……………………..………………………………………...…...මෙය/මිය/මයා
   1.2 පත්වීම් ලිපියෙහි සඳහන් නම :.........…………………....................................................
2. ජාතික හැඳුනුම්පත් අංකය :……………………………………………………………………....
   (ජාතික හැඳුනුම්පතේ සහතික කළ ඡායා පිටපතක් අංක 02 වශයෙන් අමුණා එවිය යුතුය)
3. උපන් දිනය :…………………………………………………………….....……
4. පෞද්ගලික ලිපිනය :…………………………………………………….....……………
5. දුරකථන අංකය - 5.1 නිවස :………..................................5.2 ජංගම:………….........................
   5.3 විද්‍යුත් තැපැල :……………………………………………………………………......…………
6. දැනට දරන තනතුර :…...........……………………………………………………......………..
7. අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව :……………………………….................…………
8. කාර්යාලීය ලිපිනය :………………………………………………………………….....……
9. 9.1 කාර්යාලීය දූරකථන අංකය :……………………………………………....………
   9.2 කාර්යාලීය ෆැක්ස් අංකය :………………………………………………………….................

10. පත්වීම් / උසස්වීම් දින
    10.1 ශ්‍රී ලං.ග.සේ. III ශ්‍රේණියට පත්වීම් දිනය :………………………………………
    10.2 ශ්‍රී ලං.ග.සේ. II ශ්‍රේණියට උසස්වීම් දිනය:………………………………………..
    10.3 ශ්‍රී ලං.ග.සේ. I ශ්‍රේණියට උසස්වීම් දිනය :………………………………………

    (ශ්‍රී ලං.ග.සේ. I ශ්‍රේණියට උසස් කිරීමේ ලිපියේ සහතික කළ පිටපතක් 10.3 ලෙස අංකනය කර ඇමිණිය යුතුය.)

11. I ශ්‍රේණියට උසස්වීමෙන් පසු සේවයේ නොසිටි කාල සීමාවන් සහ විනයානුකූල දඬුවම් ලැබීම මත සේවා කාලය අඩුවීම් -

11.1 නිවාඩු ලබා ගැනීම මත සේවා කාලය අඩුවීම් (අදාළ වේ නම් පමණක් සම්පූර්ණ කරන්න)

| අනු අංකය | නිවාඩු අනුමැතිය සඳහා අදාළ කොන්දේසි | කාල සීමාව | | සේවා කාලය අඩුවන දින ගණන | | |
|---|---|---|---|---|---|---|
| | | සිට | දක්වා | අවු: | මාස | දින |
| I. | ආයතන සංග්‍රහයේ V:2.5.4 | | | | | |
| II. | ආයතන සංග්‍රහයේ XII: 16 | | | | | |
| III. | ආයතන සංග්‍රහයේ XII: 36 | | | | | |
| IV. | කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 33 | | | | | |
| V. | කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 10 | | | | | |
| VI. | වෙනත් වැටුප් රහිත නිවාඩු | | | | | |
| VII. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 14/2022 අනුව වැටුප් රහිත දේශීය / විදේශීය නිවාඩු | | | | | |
| සේවා කාලය අඩුවන සම්පූර්ණ දින ගණන | | | | | | |

(නිවාඩු අනුමත කළ ලිපිවල සහතික කළ පිටපත් 11.1.i 11.1.ii, 11.1.iii ආදී වශයෙන් කරුණට අදාළව අංක කර ඇමිණිය යුතුය.)

11.2 නිලධාරියා / නිලධාරිනිය ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 14 අනුව විදේශ අධ්‍යයන නිවාඩු ලබාගෙන ඇත / නැත.

කාල සීමාව ................................................සිට................................................දක්වා

11.3 විනය කරුණු මත සේවා කාලය අඩුවීම (අදාළ වේ නම් පමණක් සම්පූර්ණ කරන්න)

| විනය තීරණය | චෝදනා පත්‍රය අනුව වරද සිදුවූ කාල සීමාව | සේවා කාලය අඩුවන දින ගණන | | |
|---|---|---|---|---|
| | | අවු. | මාස | දින |
| I. වැටුප් වර්ධක............ක් විලම්භනය කිරීම | | | | |
| II. වෙනත් | | | | |
| සේවා කාලය අඩුවන සම්පූර්ණ දින ගණන | | | | |

(විනය තීරණවල සහතික කළ පිටපත් 11.3.i, 11.3.ii ආදී වශයෙන් කරුණට අදාළව අංක කර අමුණා තිබිය යුතුය.)

11.4 ඉහත 11.1 හා 11.3 හි මුළු එකතුව : අවු. .....................මාස ........................දින..........................

11.5 I ශ්‍රේණියට පත්වූ දිනෙන් ඉදිරියට ඉහත 11.4හි කාල සීමාව ඉවත් කළ විට දිනය:..........................

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020හි සඳහන් විධිවිධානයන්ට අනුව සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

12.1 උසස්වීමට සුදුසුකම් ලබන 2026.07.01 දිනට පූර්වාසන්න වසර 05 තුළ සියලු වැටුප් වර්ධක** උපයාගෙන <u>ඇත/නැත.</u>*
(ආයතන සංග්‍රහයේ XII:16:9, XII:16:10 සහ XII:36:1:4(i) හා (ii) යටතේ ලබා ඇති වැටුප් වර්ධක උසස් වීම් සඳහා පිළිගනු නොලැබේ.)

*(අදාළ නොවන වචනය කපා හරින්න)

12.2 උසස්වීමට සුදුසුකම් ලබන 2026.07.01 දිනට පූර්වාසන්න වසර 05 තුළ වැටුප් වර්ධක ලබා නොමැති නම් වැටුප් වර්ධක 05 ලබන දින තෙක් උසස් වීමට සුදුසුකම් ලබන දිනය නැවත ගණනය කළ යුතුය. ඒ අනුව සුදුසුකම් ලබන දිනය** : ……….......……..

**(වැටුප් වර්ධක පත්‍රිකා පහේ (05) සහතික කළ පිටපත් 12.1 සිට 12.5 දක්වා අංක කර අමුණන්න)

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුව විනයානුකූල දඬුවම් ලබා නොමැති වීම.

13.1 ගොනුව අනුව, උසස් වීමට සුදුසුකම් ලබන දිනට පූර්වාසන්න වසර 05 තුළ කිසිදු විනය දඬුවමකට ලක් වී නොමැත. (දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් මේ බව ලිඛිත ප්‍රකාශයකින් සහතික කළ යුතුය - ඉල්ලුම්පතෙහි "ආ" කොටස යටතේ)

13.2 13.1 හි සඳහන් කාල සීමාව තුළ විනය දඬුවමකට ලක්ව ඇති අතර 11.2 යටතේ කරුණු සඳහන් කර ඇත්නම් සහ ඒ අනුව උසස්වීම් දිනය සංශෝධනය වේ නම් එම දිනය : ……….................

13.3 උසස් වීමට සුදුසුකම් ලබන දිනය 12.2 හා 13.2 අනුව සංශෝධනය වේ නම් නව සංශෝධිත දිනය : ……………………...............

14. පූර්වාසන්න වසර පහ (05) තුළ වාර්ෂික කාර්ය සාධන ඇගයුම අනුව වැඩ හැසිරීම යහපත් බව පිළිබිඹු වීම.

ඉහත 12 හෝ 13 අනුව සුදුසුකම් ලබන දිනට අදාළ වර්ෂයට පූර්වාසන්න වර්ෂ 05 පහත වගුවෙහි පළමු තීරුවේ සටහන් කළ යුතුය. අදාළ කාර්ය සාධන වාර්තා 05හි සහතික කළ පිටපත් ඇමිණිය යුතුය. කාර්ය සාධන වාර්තාවේ අවසාන ඇගයුමෙහි විකල්ප නිර්දේශ එකකට වඩා දක්වා ඇති සහ අදාළ නිලධාරීන්ගේ අත්සන් හා නිල මුද්‍රා තබා නොමැති වාර්තා පිළිගනු නොලැබේ.

| **වර්ෂය** | **අවසාන ඇගයුම<br>විශිෂ්ඨයි/ සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළයි/ සතුටුදායකයි/ අසතුටුදායකයි** | **අදාළ නිලධාරීන් අත්සන් තබා ඇත/නැත** |
|---|---|---|
| 2021 | | |
| 2022 | | |
| 2023 | | |
| 2024 | | |
| 2025 | | |

එක් එක් වර්ෂයේ කාර්ය සාධන වාර්තාව අනුව සෑම පේළියක් හා තීරුවක්ම සම්පූර්ණ කළ යුතුය.

15. ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවා ව්‍යවස්ථාවේ 10.3.1.හා (v) පරිශිෂ්ඨය අනුව සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

| 15.1 අනු අංකය | 15.2 පශ්චාත් උපාධිය/ වෙනත් | 15.3 විෂය ක්ෂේත්‍රය | 15.4 එම උපාධිය/ සුදුසුකම පිරිනමන ලද විශ්වවිද්‍යාලය/ ආයතනය | 15.5 එම විශ්වවිද්‍යාලය, විශ්වවිද්‍යාලයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගෙන තිබේද යන වග | 15.6 උපාධි/ පාඨමාලා කාල සීමාව (ආරම්භක හා අවසාන දිනය) | 15.7 උපාධිය/ පාඨමාලාව වලංගු දිනය |
|---|---|---|---|---|---|---|
| 1. | | | | | | |
| 2. | | | | | | |
| 3. | | | | | | |
| 4. | | | | | | |
| 5. | | | | | | |

(15.1 වශයෙන් පශ්චාත් උපාධි සහතිකයේ/පාඨමාලාවේ හා විස්තරාත්මක උපාධි සහතිකයේ/ පාඨමාලාවේ ඡායා පිටපත් සහතික කර ඇමිණිය යුතුය.)

16. උසස් වීමට සුදුසුකම් ලබන දිනට සේවයේ වසර දහඅට (18) කට නොඅඩු සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇත./නැත.*

17. තුන්වන (03) කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

17.1 සම්පූර්ණ කළ යුතු දිනය : ………………......

17.2 සම්පූර්ණ කළ දිනය : ………………......

(17 වශයෙන් අංක යොදා අදාළ සහතික පත්‍රයේ සහතික කරන ලද පිටපතක් ඇමිණිය යුතුය)

ඉහත අංක 01 සිට 17 තෙක් නිරවද්‍ය හා සම්පූර්ණ තොරතුරු සහිත ඉල්ලුම්පත්‍ර සහ අමුණා එවන ලෙස සඳහන් කර ඇති සියලු ලේඛනවල සහතික කළ පිටපත් කරුණට අදාළ අංකය එක් එක් ලේඛනයේ දකුණු ඉහළ කෙළවරෙහි සටහන් කර අංක පිළිවෙළින් අමුණා ගොනුවක් වශයෙන් සකස් කර, මේ සමඟ ඉදිරිපත් කරමි.

තවද මා විසින් උසස් කිරීම මත පත් කරනු ලැබීමට ඉල්ලා ඇති ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ විශේෂ ශ්‍රේණියේ තනතුරක් පවතින ඕනෑම සේවා ස්ථානයක/ එම ස්ථානවලට ඉතා ආසන්න ස්ථානයක ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ විශේෂ ශ්‍රේණියේ තනතුරක් සඳහා පත්කරනු ලැබීමට කැමැත්ත ප්‍රකාශ කරමි.

දිනය: ....................................                ……………………………..

ඉල්ලුම්කරුගේ අත්සන

හා තනතුරු නාමය

**සැ.යු.**

2026.01.01 දිනට ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා පැවති සම්මුඛ පරීක්ෂණයට සහභාගී වූ නිලධාරීන් මෙම නිවේදනය අනුව අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී, අයදුම්පත සමඟ 2026.01.01 සිට 2026.07.01 දක්වා වන වැටුප් වර්ධක පත්‍රිකා පමණක් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් වේ.

**(ආ) කොටස - දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සම්පූර්ණ කළ යුතුය.**

ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

1. නිලධාරියා/නිලධාරිනිය ඉහත සඳහන් කර ඇති සියලු කරුණු නිවැරදිය.

2. අංක 11,12 හා 13ට අදාළ කරුණු ගොනුව අනුව සසඳා බලන ලදී. සඳහන් කර ඇති කරුණු නිවැරදි බවද සියලු තොරතුරු සම්පූර්ණව ඉදිරිපත් කර ඇති බවද අදාළ සියලු ලේඛනවල **සහතික කළ** පිටපත් අමුණා ඉදිරිපත් කර ඇති බවද සහතික කරමි.

3. නිලධාරියාට/නිලධාරිනියට එරෙහිව විනය කටයුතු ආරම්භ කිරීමට කටයුතු කරමින් හෝ **විනය පරීක්ෂණ සිදු වෙමින් පවතියි/නොපවතියි.***

   3.1 ඉහත පිළිතුරු "පවතියි" නම් වරද කළ දිනය : .................................
   3.2 විනය බලධාරියා විසින් නිකුත් කළ චෝදනා පත්‍රයේ අංකය හා දිනය: .................................

4. .............................................................................................. මහතා / මහත්මිය / මෙනවිය ගේ රාජකාරි / පැමිණීම / හැසිරීම සතුටුදායකය. ඔහුගේ/ ඇයගේ කාර්ය සාධනය, නායකත්වය, හැකියාව හා ඊළඟ උසස් වීමට අදාළව තනතුරු හා වගකීම් දැරීමේ හැකියාව සලකා බැලීමි. ඔහු / ඇය ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කරමි /නිර්දේශ නොකරමි*

5. නිවැරදිව, අනූනව සම්පූර්ණ කළ අයදුම්පත ද, එක් එක් කරුණට අදාළ අංකය සටහන් කරමින් අංක පිළිවෙලින් අදාළ ලේඛනවල සහතික කළ පිටපත් ද අමුණා සකස් කරන ලද ගොනුව මේ සමඟ එවමි.

දිනය : ………………………………….            .................…………………………………

දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ
අත්සන, තනතුරු නාමය
සහ නිල මුද්‍රාව

සටහන : නොගැළපෙන වචන කපා හරින්න

**(ඇ) කොටස - අදාළ අමාත්‍යාංශයේ ලේකම් හෝ පළාත් ප්‍රධාන ලේකම් විසින් සම්පූර්ණ කළ යුතුය.**

ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

1. ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I ශ්‍රේණියේ...................................................... මහතා / මහත්මිය / මෙනවියගේ රාජකාරී හා හැසිරීම පිළිබඳව දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සමඟ එකඟ වෙමි. / එකඟ නොවෙමි.*

2. නිලධාරියාගේ රාජකාරි / හැසිරීම / විශේෂ කුසලතා හා කාර්ය සාධනය ඇගයීමට ලක් කළෙමි. ......................................................................... මහතා / මහත්මිය / මෙනවිය ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම **නිර්දේශ කරමි. / නොකරමි**.*
(* නිර්දේශ නොකරන්නේ නම්, හේතුව කෙටියෙන් සඳහන් කරන්න.)
..............................................................................................................................................
......................................................................................................................................

3. නිවැරදිව, අනූනව සම්පූර්ණ කළ අයදුම්පත ද, එක් එක් කරුණට අදාළ අංකය සටහන් කරමින් අංක පිළිවෙලින් අදාළ ලේඛන වල සහතික කළ පිටපත් ද අමුණා සකස් කරන ලද ගොනුව මේ සමඟ එවමි.

………………………
දිනය

...........…………………......……
අමාත්‍යාංශ ලේකම්ගේ / පළාත් ප්‍රධාන ලේකම්ගේ අත්සන

නිල මුද්‍රාව :

සටහන : නොගැළපෙන වචන කපා හරින්න.